# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 28 දරන ඇසෝෂියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ජූලි මස 20 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 28 දරන ඇසෝෂියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත**

**[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 19 වන දින]**

**එල්. ඩී.—ඕ. 6/72.**

**ඇසෝෂියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් යන නාමය යටතේ ව්‍යාපාර කරන සමාගමේ තත්ත්වය වෙනස් කිරීම සඳහා ද ඒ සමාගමේ කොටස් නැවත බෙදා හැරීම පිණිස ද ඒ සමාගමේ ව්‍යාපාර හා කටයුතු පිළිබඳ කළමනාකාරිත්වයේ හා පරිපාලනයේ වගකීම දරන මණ්ඩලය ප්‍රතිසංස්ථාපනය කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මෙම පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 28 දරන ඇසෝෂියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කළ හැකි මේ පනතෙහි " නියමිත දිනය " යනුවෙන් සඳහන් කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

**2.** ඇසෝෂියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් යන නාමය යටතේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ව්‍යාපාර කරගෙන ගිය සමාගම සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන නියමිත දිනයෙහි අදාළ වන්නේය :—

ඇසෝෂියේටඩ් නිවුස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් යන නාමය යටතේ ව්‍යාපාර කරගෙන යන සමාගමට අදාළ විශේෂ විධිවිධාන.

(අ) මින්මතු මේ පනතෙහි " සමාගම " යනුවෙන් සඳහන් කෙරෙන ඒ සමාගම, සමාගම් ආඥාපනතෙහි කාර්යයන් සඳහා, ඒ ආඥාපනතෙහි අර්ථානුකූලව, පෞද්ගලික සමාගමක් නොවන සමාගමක් වේ.

(ආ) සමාගමේ සියලු කොටස්වල මුළු ගණනින් සියයට හැත්තෑ පහකට නොඅඩු සංඛ්‍යාවක් ආණ්ඩුව වෙනුවෙන් මහා භාරකරු සතු විය යුතු අතර සමාගම විසින් මහා භාරකරු " ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් මහා භාරකරු " යන අභිධානය යටතේ සමාගමේ ඒ කොටස් දරන්නා වශයෙන් ලියාපදිංචි කොට අවශ්‍ය කොටස් සහතික ඒ අභිධානය යටතේ මහා භාරකරු වෙත නිකුත් කළ යුතු ය.

(ඇ) 63 වන සමාගම් ආකෘති පත්‍රයෙහි 1972 ජනවාරි හතර වන දින දක්වා පිළියෙළ කරනු ලැබ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාව අනුව සමාගමේ කොටස් කරුවන්ව සිටි තැනැත්තන්ට, නියමිත දින සිට සහ ඉන් පසු, සමාගමේ මුළු කොටස් සංඛ්‍යාවෙන් සියයට විසිපහකට වඩා හිමිව සිටීමේ අයිතිය නොතිබෙන්නේ ය :

එසේ වුව ද කිසිම තනි කොටස්කරුවකුට සමාගමේ 1972 ජනවාරි මස හතර වන දින පැවති මුළු කොටස් සංඛ්‍යාවෙන් සියයට දෙකකට වඩා දැරිය නොහැකි ය.

කේ 21805—9,807 (73/7)

(ආ) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට අනුකූලව, 63 වන සමාගම් ආඥාපනතේ ආකෘති පත්‍රයෙහි 1972 ජනවාරි හතර වන දින දක්වා පිළියෙළ කරනු ලැබ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාව අනුව සමාගමේ කොටස්කරුවන් ව සිටි තැනැත්තන් වන, මෙම පනතෙහි ඇති උපලේඛන යෙහි I වන තීරයේ සටහන්වල නම් සහ ලිපිනයන් සඳහන් තැනැත්තන් විසින්, ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල සඳහන් සමාගමෙහි කොටස් සංඛ්‍යාවන් දැරිය හැකි ය.

(ඉ) සමාගමේ ඉතුරු කොටස් (ආ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ආණ්ඩුව වෙනුවෙන් මහා භාරකරු සතු වන්නේ ය.

(ඊ) සමාගමේ සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය නියමිත දිනයෙහි සිට බල රහිත වන්නේ ය.

(උ) සමාගමේ අලුත් සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය නියමිත පරිදි විය යුතු ය.

(ඌ) 1972 ජනවාරි හතර වන දින හෝ ඉන් පසුව කරනු ලැබූ සමාගමේ කොටස්වල යම් අයිතිය පැවරීමක් අවලංගු වන්නේ ය.

සමාගමේ කොටස් අතුරින් යම් තැනැත්තකු විසින් දැරිය හැකි කොටස් සංඛ්‍යාව සීමා කිරීම.

3. (1) නියමිත දිනයෙන් පසු—

(අ) මහා භාරකරු හැර අන් කිසිවකු විසින් තනිවම හෝ ඔහුගේ හෝ ඇගේ භාර්යාව/ස්වාමිපුරුෂයා නැතහොත් බාල වයස්කාර දරුවකු වන යම් පුද්ගලයකු සමඟ හවුලේ හෝ එකතුව සමාගමේ මුළු කොටස් සංඛ්‍යාවෙන් සියයට දෙකකට වැඩි කොටස් සංඛ්‍යාවක් නොදැරිය යුතු ය ; තව ද,

(ආ) යම් තැනැත්තකු තනිවම හෝ එකී යම් පුද්ගලයකු සමඟ හවුලේ හෝ එකතුව හෝ සමාගමේ කොටස් අතුරින් එකී සියයට දෙකක සීමාව ඉක්මවූ යම් කොටසක් හෝ කොටස් දරන්නකු වශයෙන් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට තීරණය කිරීමේ බලය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. එකී තීරණයක් සම්බන්ධ දැන්වීම ඒ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලියාපදිංචි කළ තැපැලෙන් ඒ තැනැත්තා වෙත යැවිය යුතු ය.

(2) සමාගමේ යම් කොටසක් දරන්නකු වශයෙන් ලියාපදිංචි කිරීම (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් නියමිත කාල පරිච්ඡේදය තුළ දී ඒ තීරණයට විරුද්ධව අභියාචන යක් කොළඹ දිසා අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකි ය. ඒ අධිකරණය විසින් ඒ තීරණය ස්ථිර කරමින් හෝ ඉවත ලමින් ඒ අභියාචනය සම්බන්ධයෙන් නියමයක් කළ හැකි ය. තව ද එවැනි අභියාචනයක් ඉදිරිපත් කිරීමේ දී සහ එය විභාග කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය නියමිත පරිදි විය යුතු ය.

(3) කොළඹ දිසා අධිකරණය වෙත (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් ඒ අධිකරණය විසින් කරන ලද යම් නියමයක් අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර, නඩුවක, ප්‍රතිශෝධන ඉල්ලීමක, අභියාචනයක හෝ රිට් ආඥාවක මාර්ගයෙන් හෝ අන් ආකාරයකින් එම නියමය වෙනත් යම් අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

මහා භාරකරු සතුවන සමාගමේ කොටස් සම්බන්ධයෙන් වන්දි.

4. 2 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම කරණකොට ගෙන මහා භාරකරු සතු වන සමාගමේ එක් එක් කොටස වෙනුවෙන් ගෙවිය යුතු වන්දි, නියමිත දිනයට පෙර දිනයෙහි සමාගමේ ඒ කොටස දරූ තැනැත්තාට, පහත සඳහන් කරුණුවලට අදාළව නිශ්චය කරනු ලබන මිලකට අනුව, මහා භාරකරු විසින් ආණ්ඩුව වෙනුවෙන් ගෙවිය යුතු ය :—

(අ) ඒ කොටසේ මුල් අගය ;

(ආ) ඒ කොටස් දරන්නන් අතර එදිනට පෙර මෑතදීම ඒ කොටස් සම්බන්ධයෙන් කෙරුණු ගනුදෙනුවක දී ගෙවනු ලැබූ මිල ; සහ

(ඇ) ඒ කොටස සම්බන්ධයෙන් ඇවරකරුගේ තක්සේරුව.

මහා භාරකරු සතු වන සමාගමේ කොටස් මහජනයාට විකිණීම.

5. (1) අමාත්‍යවරයා විසින් කලින් කල තත් කාර්යය සඳහා මහා භාරකරු වෙත නිකුත් කරනු ලබන ලිඛිත විධානවල බලය යටතේ ක්‍රියා කරමින්, මහා භාරකරු විසින්, 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව—

(අ) මහජනයා අතුරින් ඒ විධානවල සඳහන් කර ඇති අය වෙත ;

(ආ) තමා වෙත සතු වී ඇති සමාගමේ කොටස් අතුරින් එසේ සඳහන් කර ඇති යම් කොටස් සංඛ්‍යාවක් ;

(ඇ) එසේ සඳහන් කර ඇති මිලකට,

විකිණිය යුතු ය.

(2) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද යම් ලිඛිත විධාන අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර, 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ විධාන නඩුවක, ප්‍රතිශෝධන ඉල්ලීමක, අභියාචනයක හෝ රිට් ආඥාවක මාර්ගයෙන් හෝ අන් ආකාරයකින් යම් අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

ඇතැම් කරුණු සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.

6. (1) මේ උපවගන්තියෙහි මින් මතු දක්වනු ලබන විධිවිධාන පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් බල පැවැත්විය යුතු ය :—

(අ) නියමිත දිනයට පෙර දිනයෙහි සිටි සමාගමේ අධ්‍යක්ෂවරුන් එසේ ධුර දැරීම නියමිත දිනයෙහි නතර විය යුතු ය.

(ආ) සමාගමේ ව්‍යාපාර හා කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය හා පරිපාලනය මේ වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි සංස්ථාපිත අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු වන්නේ ය.

(ඈ) එසේ සංස්ථාපිත අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සමාගමේ ව්‍යාපාර පවත්වාගෙන යාමේ හා කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා සමාගමේ බලතල ක්‍රියාත්මක කිරීම, කටයුතු කිරීම හෝ කාර්ය ඉටු කිරීම කළ හැකි ය.

(ඇ) නියමිත දිනයෙන් පසු සමාගමේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය. එම අධ්‍යක්ෂවරුන් සියලු දෙනාම මහා භාරකරු විසින් පත් කළ යුතු අතර—

(i) යටත් පිරිසෙයින් ඔවුන්ගෙන් එක් කෙනකු වත් නියමිත දිනයට පෙර දිනයෙහි සමාගමේ යම් කොටසක් දැරූ තැනැත්තකු විය යුතු ය ;

(ii) යටත් පිරිසෙයින් ඔවුන්ගෙන් එක් කෙනකු වත් සමාගමෙහි පුවත්පත් කලාවේදියකු වශයෙන් වැඩ කරන තැනැත්තකු විය යුතු ය ; තව ද

(iii) යටත් පිරිසෙයින් ඔවුන්ගෙන් එක් කෙනකු වත් සුදුසුකම් ලත් ගණකාධිකාරිවරයකු වන තැනැත්තකු විය යුතු ය.

මහා භාරකරු විසින් අධ්‍යක්ෂවරුන්ගෙන් කෙනකු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් පත් කළ යුතු ය.

(ඉ) නියමිත දිනයෙන් පසු සමාගමේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය සංයුක්ත වන අධ්‍යක්ෂවරුන් ඒ ධුර කලින් හැර ගියහොත් මිස, සමාගමේ පළමුවන වාර්ෂික මහා සභා රැස්වීම අවසන් වන තුරු ඒ අධ්‍යක්ෂවරුන් වශයෙන් ධුර දැරිය යුතු ය.

(ඊ) සමාගමේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීම නියමිත දිනයේ සිට එක් අවුරුදු කාලසීමාවක් ගතවීමට පෙර පැවැත්විය යුතු ය.

(උ) නියමිත දිනයෙන් පසු සමාගමේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීමේ දී හා ඉන් පසුව පැවැත්වෙන සමාගමේ සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දී සමාගමේ කොටස් දරන තැනැත්තන් විසින් ඔවුන් අතුරින් සමාගමේ අධ්‍යක්ෂවරුන් පස් දෙනකු තෝරා පත් කළ යුතු අතර ඔවුන් කලින් ධුර හැර ගියහොත් මිස සමාගමේ ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම අවසන් වන තුරු එම අධ්‍යක්ෂවරුන් වශයෙන් ධුර දැරිය යුතු ය :

එසේ වුව ද මහා භාරකරු විසින් ආණ්ඩුව වෙනුවෙන්—

(i) සමාගමේ මුළු කොටස් සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් සියයට පණස් එකක්වත් දරන අවස්ථාවක එකී අධ්‍යක්ෂ වරුන් දෙදෙනකු පමණක් එසේ තෝරා පත් කර ගත යුතු අතර සෙසු අධ්‍යක්ෂවරුන් තිදෙනා මහා භාරකරු විසින් පත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ii) ඒ මුළු කොටස් සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් දරන අවස්ථාවක එකී අධ්‍යක්ෂවරුන් තුන් දෙනකු පමණක් එසේ තෝරා පත් කර ගත යුතු අතර සෙසු අධ්‍යක්ෂවරුන් දෙදෙනා මහා භාරකරු විසින් පත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(iii) ඒ මුළු කොටස් සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් සියයට විස්සක් වත් දරන අවස්ථාවක, එකී අධ්‍යක්ෂවරුන් හතර දෙනකු පමණක් එසේ තෝරා පත් කර ගත යුතු අතර අනික් අධ්‍යක්ෂවරයා මහා භාරකරු විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂවරුන් පත් කිරීමට මහා භාරකරුට හිමිකම් ඇති තාක් කල් හා ඒ තාක් කල් පමණක් සමාගමේ සෙසු අධ්‍යක්ෂවරුන් තෝරා පත් කිරීමෙහිලා සහභාගි වීමට හෝ ඒ සම්බන්ධයෙන් ඡන්දය දීමට හෝ මහා භාරකරුට හිමිකම් නොතිබිය යුතු ය.

(3) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙන් නියමිතව තිබිය හැකි පරිදි අධ්‍යක්ෂවරයකු වීමට අවශ්‍ය සුදුසුකම් ලබා දෙන කොටස හෝ කොටස් යම් තැනැත්තකුට සමාගමෙහි නොතිබුණද මහා භාරකරු විසින් ඒ තැනැත්තා සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කළ හැකි ය.

(4) මහා භාරකරු විසින් (1) වන උපවගන්තියේ (උ) ඡේදය යටතේ පත් කරන ලද සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ අධ්‍යක්ෂවරුන් කලින් තම ධුර හැර ගිය හොත් මිස ඔහුගේ හෝ ඔවුන්ගේ පත්වීමෙන් පසු සමාගමේ ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම අවසාන වන තෙක් ඒ අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරුන් වශයෙන් ධුර දැරිය යුතු ය.

7. යම් තැනැත්තකු— 

සමාගමේ අධ්‍යක්ෂවරයකු වීම සඳහා නුසුදුසුකම්.

(අ) කූට ලිපි සකස් කිරීමේ හෝ වංචා කිරීමේ වරදට හෝ විනිමය පාලන පනතේ හෝ 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ හෝ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන කඩකිරීමේ හේතුවෙන් කරන ලද යම් වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ ඇතහොත් හෝ වරදකරු කරනු ලබතහොත්, නියමිත දිනය හෝ ඔහු වරදකරු කරනු ලැබීමේ දිනය හෝ යන මේ දින දෙකින් කලින් එළඹෙන දිනයෙහි සිට අවුරුදු තුනක කාලයකට ; හෝ

(ආ) (අ) ඡේදයෙහි සඳහන් යම් වරදක් කර ඇති බව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිසමක් විසින් තීරණය කරනු ලැබ ඇතහොත් හෝ තීරණය කරනු ලබතහොත් නියමිත දිනයෙහි සිට අවුරුදු තුනක කාලයකට

සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ තෝරා පත් කර ගනු ලැබීමට හෝ ධුරයෙහි රැඳී සිටීමට ඒ තැනැත්තා සුදුස්සකු නොවිය යුතු ය.

8. (1) සමාගමේ අධ්‍යක්ෂවරයකු,—

සමාගමේ අධ්‍යක්ෂවරුන් ධුර හැර යාම.

(අ) ඔහු පත් කළ අධ්‍යක්ෂවරයකු නම්, මහා භාරකරු විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ සමාගමේ ලේකම් වෙත යවනු ලබන ලිපියකින් ධුරයෙන් ඉල්ලා අස් වුවහොත් ; හෝ

(ආ) ඔහු තෝරා පත් කළ අධ්‍යක්ෂවරයකු නම්, සමාගමේ ලේකම් මාර්ගයෙන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති වෙත යවනු ලබන ලිපියකින් ධුරයෙන් ඉල්ලා අස් වුවහොත්

තම ධුරය හැර යා යුතු ය.

(2) ඉල්ලා අස්වීමෙන් හෝ කාලය ඉකුත් වීමෙන් ධුරය හැර යන සමාගමේ යම් අධ්‍යක්ෂවරයෙක් නැවත පත්කර ගනු ලැබීමට හෝ නැවත තෝරා පත් කරගනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

නියමිත දිනයෙන් පසු සමාගමේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන තෙක් මහා භාරකරුගේ බලතල යනාදිය.

**9.** නියමිත දිනයෙන් පසු සමාගමේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන තෙක් සමාගමේ ව්‍යාපාර කරගෙන යාමේ හා කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා සමාගමේ බලතල, කටයුතු හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම මහා භාරකරු විසින් කළ හැකි ය.

සමාගමේ කොටස් පැවරීම සීමා කිරීම.

**10.** (1) අදහස් කර ඇති පැවරීම පිළිබඳව මහා භාරකරු වෙත ලියවිල්ලකින් වූ පූර්ව දැන්වීමක් කිරීමෙන් පසුව මිස සමාගමේ කොටස් දරන කිසිම තැනැත්තකු විසින් අන් කිසි තැනැත්තකු වෙත ඒ කොටස් පැවරීම නොකළ යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන කඩ කරමින් කරන ලද යම් පැවරීමක් මහා භාරකරුගේ නියමය පරිදි බලරහිත ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. ඒ නියමය පිළිබඳ දැන්වීමක් මහා භාරකරු විසින් ඒ කොටස් දරන්නා වෙත ලියාපදිංචි කළ ලිපියකින් තැපැල් මගින් යැවිය යුතු ය.

(3) සමාගමේ යම් කොටසක් එවැනි තැනැත්තකු වෙත පැවරීමකට අදාළව (2) වන උපවගන්තිය යටතේ මහා භාරකරු විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් නියමිත කාලසීමාව ඇතුළත දී, ඒ නියමයට විරුද්ධව කොළඹ දිසා අධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. ඒ අධිකරණය විසින්, ඒ අභියාචනය සම්බන්ධයෙන්, ඒ නියමය ස්ථිර කරමින් හෝ නිෂ්ප්‍රභ කරමින් තීරණයක් කළ හැකි ය. ඒ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර නඩුවක, ප්‍රතිශෝධන ඉල්ලීමක, අභියාචනයක, රිට් ආඥාවක මාර්ගයෙන් හෝ අන් ආකාරයකින් වෙනත් යම් අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී එය ප්‍රශ්න නොකළ යුතු ය.

(4) යම් තැනැත්තකු වෙත සමාගමේ යම් කොටසක් පැවරීම සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ මහා භාරකරු විසින් නියමයක් කළ අවස්ථාවක අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් පසු කොළඹ දිසා අධිකරණය විසින් ඒ නියමය නිෂ්ප්‍රභ කරනු ලබන තෙක් ඒ කොටස් සම්බන්ධයෙන් ඡන්දය දීමේ අයිතිවාසිකම් ඒ තැනැත්තාට නොතිබිය යුතු ය.

සමාගමේ සංස්ථා පත්‍රය හා සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රත්‍යාදිෂ්ට කිරීම ආදිය සම්බන්ධයෙන් සීමා කිරීම.

**11.** සමාගමේ සංස්ථා පත්‍රය හා සාංගමික ව්‍යවස්ථාවලිය,—

(අ) මහා භාරකරුගේ පූර්ව අනුමතිය ඇතිව, සමාගමේ යම් රැස්වීමක දී සම්මත කර ගනු ලබන විශේෂ යෝජනාවක් මගින් සමාගමේ කොටස් දරන්නන් විසින් මිස ; හෝ

(ආ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියෝගයක් මගින් අමාත්‍ය වරයා විසින් මිස

ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ සංශෝධනය කිරීම නොකළ යුතු ය.

**12.** සමාගමේ මුළු කොටස් ගණනින් යටත් පිරිසෙයින් සියයට පනස් එකක්වත් ආණ්ඩුව වෙනුවෙන් මහා භාරකරු විසින් දරනු ලබන තාක් කල් හා ඒ තාක් කල් පමණක් ඔහු විසින් කලින් කල සමාගම විසින් පළ කරනු ලබන යම් ප්‍රවෘත්ති පත්‍රයක ප්‍රතිපත්තිය හෝ නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම නොවන්නා වූ සමාගමට අදාළ යම් කරුණු පිළිබඳව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලියවිල්ලකින් සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කළ හැකි ය. ඒ විධාන ලැබීමෙන් පසු ඒවා අනුව වහාම ක්‍රියා කිරීම හා ඊට පසු ඒ විධාන මණ්ඩලයේ ඊළඟ රැස්වීමට ඉදිරිපත් කිරීම ඒ මණ්ඩලයේ කාර්ය වන්නේ ය.

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විධාන නිකුත් කිරීමට මහා භාරකරු සතු බලය.

**13.** (1) සමාගම විසින් නියමිත දිනයට පෙර අන් කිසි තැනැත්තකු හෝ තැනැත්තන් සමඟ ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ වූ එම සමාගමේ වගකීම්, ඒ වගකීම් ව්‍යාජයෙන්, වංකව හෝ වංචනිකව ඇති කරගෙන ඇතැයි යන හේතුව පිට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ පූර්ව අනුමතිය ඇතිව ලියවිල්ලකින් ප්‍රතික්ෂේප කළ හැකි ය. එවිට ඒ වගකීම් කිසිවිටකත් සමාගමේ වගකීම්ව නොපැවති ලෙස හෝ නොපවතින ලෙස සැලකිය යුතු ය. ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ දැන්වීම ලියාපදිංචි කළ ලිපියකින් මණ්ඩලය විසින් ඒ අන් තැනැත්තා හෝ තැනැත්තන් වෙත තැපැල් මාර්ගයෙන් යැවිය යුතු ය.

ඇතැම් ගිවිසුම් යටතේ වගකීම් ප්‍රතික්ෂේප කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු බලය.

(2) යම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ වූ යම් වගකීම් (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කිරීම හේතුකොට ගෙන යම් තැනැත්ත කුට දරන්නට සිදු වන යම් පාඩුවක් හෝ අලාභයක් සඳහා, ඒ තැනැත්තා ඒ ගිවිසුමට හෝ එකඟවීමට පාර්ශ්වකරුවකු වුව ද නොවුව ද (3) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැර, ඒ තැනැත්තාට සමාගම විසින් කිසිම වන්දියක් නොගෙවිය යුතු ය.

(3) යම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ සමාගමේ වගකීම් (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක, ඒ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවේ දී ඒ ගිවිසුමේ හෝ එකඟවීමේ අන් පාර්ශ්වකරු හෝ පාර්ශ්වකරුවන් විසින් ඒ ගිවිසුම හෝ එකඟවීම යටතේ වූ ඔහුගේ හෝ ඔවුන්ගේ බැඳීම් යථා පරිදි ඉටු කර තිබුණේ නම් ඒ ප්‍රතික්ෂේප කිරීම හේතුකොට ගෙන ඔහුට හෝ ඔවුන්ට විඳීමට සිදු වූ පාඩුව හෝ අලාභය සඳහා ඒ අන් පාර්ශ්වකරුට හෝ පාර්ශ්වකරුවන්ට සමාගම විසින් වන්දි ගෙවිය යුතු ය. ඒ වන්දියෙහි ප්‍රමාණය, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය හා ඒ අන් පාර්ශ්වකරු හෝ පාර්ශ්වකරුවන් හා අතර එකඟවීමකින් සේවා ප්‍රමාණ මූල ධර්මය අනුව හෝ එවැනි එකඟ වීමක් ඇති නොවුවහොත් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන බේරුම් කරුවකු විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. ඒ නිශ්චය කිරීම අවසානාත් මක හා තීරණාත්මක විය යුතු අතර නඩුවක, ප්‍රතිශෝධන ඉල්ලීමක, අභියාචනයක හෝ රිට් ආඥාවක මාර්ගයෙන් හෝ අන් ආකාරයකින් කිසිම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී එය ප්‍රශ්න නොකළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සමාගම විසින් ගෙවිය යුතු යම් වන්දියක් සමාගමේ මුදල්වලින් ගෙවිය යුතු අතර ඒ අනුව ඒ ගෙවීම ඒ මුදල් නීත්‍යනුකූලව වැය කළ හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

නියමිත දිනයට පෙර කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ගෙවීමට අධිකරණය නියම කරන මුදල් 4 වන වගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි මුදල්වලින් ගෙවිය හැකි බව.

**14.** නියමිත දිනයට පෙර දරන්නාට සිදු වූ හෝ සිදු කරන ලද යම් පාඩුවක්, හානියක් හෝ අලාභයක් සඳහා සමාගමට විරුද්ධව පවරන ලද නඩුවක දී යම් තැනැත්තකුට යම් මුදලක් ගෙවන ලෙස සමාගමට නියම කරමින් සමාගමට විරුද්ධව තීන්දු ප්‍රකාශයක් කරන ලද අවස්ථාවක මේ පනතෙහි හෝ වෙන යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුවද, එම මුදල 4 වන වගන්තිය යටතේ වන්දි වශයෙන් ගෙවිය යුතු මුදලෙන් ප්‍රමාණානුකූල පදනමක් මත අඩු කොට සමාගම විසින් ඒ තැනැත්තාට ගෙවනු ලැබිය හැකි ය.

නියමිත දිනයට පෙර උද්ගත වූ හිමිකම් පෑම් සම්බන්ධයෙන් නඩු පැවරීමට පෙර කළ යුතු දැනුම් දීම.

**15.** නියමිත දිනයට පෙර උද්ගත වූ කවර ආකාරයක වූ හෝ යම් කිසි හිමිකම් පෑමක් නියමිත දිනයේ සිට මාස හයක් ඇතුළත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලියවිල්ලකින් දැනුම් දෙන ලද නම් මිස හා ඒ දැන්වීම කරන ලද බවට ප්‍රකාශයක් ඒ නඩුවේ පැමිණිල්ලෙහි අන්තර්ගතව ඇත්නම් මිස, වෙන යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුවද, එම හිමිකම් පෑම සම්බන්ධයෙන් කිසිම නඩුවක් කිසිම අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක පැවරීම හෝ කිසිම අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් භාර ගැනීම නොකළ යුතු ය.

සමාගමේ ගිණුම් විගණනය කිරීමට අදාළ විශේෂ විධිවිධාන.

**16.** (1) සමාගමේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් සමාගම් ආඥාපනතේ විධිවිධාන සමාගමට අදාළ නොවන්නේ ය.

(2) 1971 අංක 38 දරන මුදල් පනතේ 12 සිට 15 තෙක් වූ (එම වගන්ති දෙක ම ඇතුළුව) වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සමාගමේ ගිණුම් විගණනය කිරීමට අදාළ වන්නේ ය.

(3) සමාගමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය.

නියෝග සෑදීමේ බලය.

**17.** (1) අමාත්‍යවරයා විසින්, මේ පනතෙහි ප්‍රතිපත්තිවලට හා විධිවිධානවලට සම්පූර්ණ බලය හා බලාන්විත භාවය දීමේ කාර්යය සඳහා, සහ නියම කළ යුතු යයි මේ පනතින් නියමිත සියලු කරුණු සඳහා නියෝග සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් සමාගම් ආඥාපනතෙහි නිශ්චිතව සඳහන් විධිවිධානවලින් යම් විධිවිධාන සමාගමට අදාළ නොවිය යුතු බවට හෝ නිශ්චිතව සඳහන් කළ හැකි වෙනස් කිරීම්වලට හෝ සංශෝධනවලට යටත්ව අදාළ විය යුතු බවට නියෝග සෑදිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත

කරනු නොලැබූ සෑම නියෝගයක් ම එසේ අනුමත නොකරනු ලැබීමේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

ඇතැම් සාධන පත්‍ර, මහා භාරකාර ආඥා පනත හා සමාගම් ආඥාපනත අභිභවා මේ පනත බල පැවැත්විය යුතු බව.

**18.** (1) සමාගමේ සංස්ථා පත්‍රයෙහි හා සාංගමික ව්‍යවස්ථාවලියෙහි කුමක් සඳහන් ව ඇත ද මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන හා මහා භාරකාර ආඥාපනතේ හෝ සමාගම් ආඥාපනතේ විධිවිධාන හා අතර යම් ගැටුමක් හෝ නොගැලපීමක් ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන එකී යම් ආඥාපනතක විධිවිධාන අභිභවා බල පැවැත්විය යුතු ය. එසේ වුව ද මෙහි මින් පෙර විධිවිධාන සලස්වා ඇති පරිදි හැර සමාගම් ආඥාපනතේ විධිවිධාන ඉදිරියටත් සමාගමට අදාළ විය යුතු ය.

අර්ථ නිරූපණය.

**19.** මේ පනතෙහි—

" බාලවයස්කාර දරුවා " යන්නෙන් අවිවාහක හා වයස අවුරුදු විසිඑකට අඩු දරුවකු අදහස් වන අතර සුළු දරුවෙක් හෝ දරුකමට හද ගැනීමේ ආඥාපනත යටතේ හදගනු ලබන දරුවෙක් හෝ එයට ඇතුළත් වේ;

" මහාජනයා " යන්නට ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමිති, සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද සමිති, වෘත්තීය සංගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද වෘත්තීය සංගම්, සමාගමේ සේවයෙහි යෙදී සිටින පුවත්පත් කලාවේදීන් වශයෙන් වැඩ කරන තැනැත්තන් හා වෙනත් තැනැත්තන් ඇතුළත් වන නමුදු, ප්‍රවෘත්ති පත්‍රයක් මුද්‍රණය කිරීමේ හෝ ප්‍රසිද්ධ කිරීමේ ව්‍යාපාරයෙහි නියුක්තව සිටින අන් කිසි සමාගමක් එයට ඇතුළත් නොවේ;

"මහා භාරකරු" යන්නෙන් මහා භාරකාර ආඥාපනතෙහි විධිවිධාන යටතේ පත් කරන ලද මහා භාරකරු අදහස් වේ.

## උපලේඛනය

| I වන තීරය | | | II වන තීරය |
|---|---|---|---|
| නම | | | |
| පෙළපත් නාමය | වෙනත් නම් | ලිපින | කොටස් ගණන |
| අබයසේකර | අර්ල් එබනේසර් කෝක් | 10, ටී. ඒ. කුරේ මාවත, කොළඹ 6 | 41 |
| ගෝමස් | ජෝර්ජ් බෙන්ජමින් සිරිසේන | 113, 5 වැනි පටුමග, කොළඹ 3 | 11,110 |
| ගෝමස් | ජෝර්ජ් බෙන්ජමින් සිරිසේන | 113, 5 වැනි පටුමග, කොළඹ 3 | 1,963 |
| වික්‍රමසිංහ | සිරිල් එස්මන්ඩ් ලූෂන් | 115, 5 වැනි පටුමග, කොළඹ 3 | |
| ගෝමස් | ඉන්ද්‍රා රානී | 113, 5 වැනි පටුමග, කොළඹ 3 | 19,533 |
| ගුණරත්න | ලාල් චන්ද්‍රා | 30/1, බගතලේ පාර, කොළඹ 3 | 3,867 |
| ගුණරත්න | කුසුමා ලීලමනී | 30/1, බගතලේ පාර, කොළඹ 3 | 20,000 |
| හුලුගල්ල | චිත්තා රන්ජන් | 25, අනුලා පාර, හැව්ලොක් පාරෙන් ශාඛාගත, කොළඹ 6 | 55 |
| හුලුගල්ල | හලින් අර්ජුන ජයතිලක | 25, අනුලා පාර, හැව්ලොක් පාරෙන් ශාඛාගත, කොළඹ 6 | 867 |
| හුලුගල්ල | උපතිස්ස | 39, අසෝක ගාඩ්න්ස්, කොළඹ 4 | 721 |
| හුලුගල්ල | චාර්ල්ස් හරිස්චන්ද්‍ර ද සොයිසා | 39, අසෝක ගාඩ්න්ස්, කොළඹ 4 | 165 |
| ජයවර්ධන | ජූනියස් රිචඩ් | 66, වෝඩ් පෙදෙස, කොළඹ 7 | 978 |
| නෙල්සන් | පර්සිවල් ක්ලෙමන්ට් ඇනස්ලි | 17, ඩීන්ස්ටන් පෙදෙස, කොළඹ 3 | 1,090 |
| සෙනෙවිරත්න | ලිසී හැරියට් | 22, ඩෝසන් පාර, කොළඹ 5 | 888 |
| තෙන්නකෝන් | සෙමිතා | " ඉක්සොරා ", ග්‍රීන් පාත්, කොළඹ 3 | 165 |
| වික්‍රමසිංහ | සිරිල් එස්මන්ඩ් ලූෂන් | 115, 5 වැනි පටුමග, කොළඹ 3 | 2,500 |
| වික්‍රමසිංහ | දමයන්තා | 228, හැව්ලොක් පාර, කොළඹ 5 | 13 |
| වික්‍රමසිංහ | නාලිනී මර්සියා | 115, 5 වැනි පටුමග, කොළඹ 3 | 20,000 |
| වික්‍රමසිංහ | චන්න ලලිත් | 115, 5 වැනි පටුමග, කොළඹ 3 | 83 |
| වික්‍රමසිංහ | ශාන්තිලාල් නිල්කාන්ත් | 113, 5 වැනි පටුමග, කොළඹ 3 | 2,583 |
| වික්‍රමසිංහ | රනිල් | 113, 5 වැනි පටුමග, කොළඹ 3 | 2,583 |
| වික්‍රමසිංහ | අයන්දේවී ෂාණිකා | 113, 5 වැනි පටුමග, කොළඹ 3 | 83 |

| | | | |
|---|---|---|---|
| වික්‍රමසිංහ | රන්ජන නිරාජ් | 113, 5 වැනි පටුමග, කොළඹ 3 | 83 |
| විජේතුංග | පමෙලා මානෙල් | 10, පාම් ග්‍රෝව්, කොළඹ 3 | 235 |
| විජේවර්ධන | අයන්ස්ලි ලෙව්ලින් | 40, ග්‍රීන් පාත්, කොළඹ 3 | 165 |
| විජේවර්ධන | අනුලා කල්‍යාණවතී | " නිර්මල ", 34, තර්ස්ටන් පාර, කොළඹ 3 | 91 |
| විජේවර්ධන | අස්විනි කුමාර් | " ශ්‍රියාල ", 14, එලියට් පෙදෙස, කොළඹ 8 | 1,846 |
| විජේවර්ධන | ඩොනල්ඩ් ජෝශප් | 38, ග්‍රීන් පාත්, කොළඹ 3 | 165 |
| විජේවර්ධන | දයෙන්ද්‍ර සේන | 48, සිරිපා පාර, කොළඹ 5 | 1,735 |
| විජේවර්ධන | ග්ලෙනී කොන්ස්ටන්ස් | " ශ්‍රියාල ", 14, එලියට් පෙදෙස, කොළඹ 8 | 12,145 |
| විජේවර්ධන | අයිරාංගනී | 38, ග්‍රීන් පාත්, කොළඹ 3 | 346 |
| විජේවර්ධන | කමලිකා ජානකී | 48, සිරිපා පාර, කොළඹ 5 | 6,944 |
| විජේවර්ධන | මියුරියල් | 40, ග්‍රීන් පාත්, කොළඹ 3 | 11,922 |
| විජේවර්ධන | පිලිප් රේවත | 133, වරට් පාර, කොළඹ 3 | 1,256 |
| විජේවර්ධන | පිලිප් සීවලී | මහල්වරාව වත්ත, පන්නිපිටිය | 20,000 |
| විජේවර්ධන | පිලිප් උපාලි | 38/1, තර්ස්ටන් පාර, කොළඹ 3 | 2,527 |
| විජේවර්ධන | රන්ජිත් සුජීව | 99, බ්‍රෙබෘක් පෙදෙස, කොළඹ 2 | 20,000 |
| විජේවර්ධන | අසෝක චන්ද්‍රලාල් | 671/1, හයි ලෙවල් පාර, ගංගොඩවිල, නුගේගොඩ | 1,853 |
| මූණසිංහ | ගොඩ්වින් ඩග්ලස් | 21, ගාලු පාර, දෙහිවල | 23 |